## මඩකලපුව මහානගර සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 09 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2010 ජුනි 11 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මඩකලපුව මහානගර සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහානගර සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1:3.1 ගෙවියයුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු.13,117,204 ක් විය.

#### 1:3.2 අනුකූල නොවීම්

විගණනයේදී අනාවරණය වූ නීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) | |
| (අ) 253(1) වගන්තිය | නිල නිවාස පදිංචිකරුවන්ගෙන් හා මඩකලපුව |

විවිධ පොදු වෙළඳ පොළ වෙළඳුන්ගෙන් හා වෙළඳ කුටි අයිතිකරුවන්ගෙන් ලැබිය යුතු එකතුව රු.මිලියන 3.09 ක් වූ බදු කුලී අයකර ගැනීමට මහා නගර සභා කොමසාරිස් විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 242 වගන්තිය

එකතුව රු.මිලියන 28.26 ක් වූ හිඟ වරිපනම් බදු කාර්තු 2 කට වැඩි කාලයක් අයකර ගැනීමට පියවර ගැනීමෙන් තොරව පැවතුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,699,982 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,500,424 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, හිඟ ආදායම

නගරාධිපති විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 15,754 | 16,398 | 28,088 | 19,374 | 16,332 | 28,732 |
| (ii) | බදු කුලී | 13,855 | 9,152 | 12,222 | 13,012 | 11,140 | 7,519 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,834 | 4,074 | 2,488 | 4,969 | 4,278 | 1,727 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (iv) | වෙනත් ආදායම් | 165 | 15,652 | 67 | 20,430 | 21,153 | 166 |

## 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| <u>පුනරාවර්තන වියදම</u> | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 122,257 | 94,345 | 27,912 | 129,683 | 104,000 | 25,683 |
| වෙනත් | 19,021 | 7,226 | 11,795 | 29,401 | 23,805 | 5,596 |
| උප එකතුව | 141,278 | 101,571 | 39,707 | 159,084 | 127,805 | 31,279 |
| මූලධන වියදම | 89,377 | 11,557 | 77,820 | 120,000 | 26,467 | 93,533 |
| මුළු එකතුව | 230,655 | 113,128 | 117,527 | 279,084 | 154,272 | 124,812 |

## 2:4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට අනුමත | 2010 දෙසැම්බර් 31 දිනට තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 05 | 05 |
| ද්විතීය ශ්‍රේණිය | 61 | 61 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 335 | 335 |
| වෙනත් (අනියම් / තාවකාලික) | - | 62 |
| | 401 | 463 |

**2:5 වත්කම් කළමනාකරණය**

**2:5:1 ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ රු.8,487,617 ක් විය.

**2:5:2 අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු සේවක ණය ශේෂ එකතුව රු.280,293 ක් වු අතර වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්මවු අයකරගතයුතු ශේෂ එකතුව රු.280,294 ක් විය.

**2:5:3 සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.322,005,438 ක් විය.

**2:6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**2:6:1 ඉදිකිරීම් හා නඩත්තු කටයුතු පිළිබඳ දුර්වල පාලනය**

ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන කරනු ලැබේ.

(අ) එක් එක් කාර්යය වෙනුවෙන් ශ්‍රම ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි.

(ආ) සභාව විසින් ඉදිකිරීම් වැඩ චෙක් රෝල් ශ්‍රමිකයන් භාවිතයෙන් ක්‍රියාත්මක කර තිබුණු අතර ශ්‍රමය නියමිත පරිදි බෙදා හැර බවට තහවුරු කර ගැනීම සඳහා එක් එක් කාර්යයට අදාලව යොදාගත් ශ්‍රමිකයන් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) එක් එක් කාර්යයන් සඳහා නිකුත්කර තිබුණු ද්‍රව්‍ය පිරිවැය එම කාර්යය සඳහාම අයකර නොතිබීම නිසා නිකුත් කළ අමුද්‍රව්‍ය පාලනයක් නොවීය.

(ඈ) පහත දැක්වෙන පොත් හා වාර්තා පවත්වා නොතිබුණි.

i. ගබඩාවට ආපසු භාර දුන් ද්‍රව්‍ය

ii. සක්කගල් හා බොරළු (gravel) පිළිබඳ ලේඛනය

iii. එක් එක් කාර්යයේ ඇස්තමේන්තුව හා වවුචරයට යොමව සහිතව කාර්ය මිණුම් විස්තර සහිත මිණුම් ලේඛනය.

**2:6:2 ගබඩා පිළිබඳ දුර්වල පාලනය**

(අ) ඉන්වෙන්ට්‍රි ලේඛන හා ගබඩා ලෙජර් විධිමත්ව පවත්වා නොතිබුණු අතර ද්‍රව්‍ය හා භාණ්ඩ ලැබීම් හා නකුත්කිරීම් ප්‍රමාණයන් සමඟ පරීක්ෂාකර මාණ්ඩලික නිලධාරියා විසින් කෙටි අත්සන තබා නොතිබුණි.

(ආ) ගබඩාව ක්‍රමවත්ව තබා නොතිබුණු අතර ගබඩා විෂයයන් කාණ්ඩ කර ගබඩා ලෙජර වලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) විදුලි සම්බන්ධ විෂයයන් ලංකා විදුලි බල මණ්ඩලයට භාර දී තිබුණි. කෙසේ වුවද අදාල ගිණුම් වල කිසිදු ගැලපීමක් සිදු කර නොතිබුණි.

(ඈ) වැඩ බිම්වලින් ආපසු එවන ලද ගබඩා ද්‍රව්‍ය පාවිච්චි කරන ලද විෂයයන් යටතේ ගබඩාවේ ගබඩා කර නොතිබුණි.

(ඉ) ගඟේ වැලි, බොරළු හා සක්කගල් ආදී ගොඩනැගිලි ද්‍රව්‍ය නිසි පරිදි ගොඩගසා නොතිබුණු අතර, එහෙයින් පැවති තථ්‍ය තොගය මැන ගැනීම ඉතා දුෂ්කර විය.

**2:7 කොන්ත්‍රාත් පරිපාලනය**

**මහ නගර සභා මන්ත්‍රීවරුන්ට වෙන්කරන ලද අරමුදල් වලින් මාර්ග කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පොදු නිරීක්ෂණ**

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) කොන්ත්‍රාත් වැඩ සඳහා සභා මන්ත්‍රීවරුන්ට අරමුදල් වෙන් කිරීමට 1987 මහ නගර සභා ආඥා පනතේ ( 252 අධිකාරය ) IX කොටසට අනුව ප්‍රතිපාදන නොවීය.

(ii) මාර්ග, වැසිකිළි හා නළ ළිං ඉදිකිරීම් කාර්යයන් සඳහා කොන්ත්‍රාත්තු ග්‍රාම සංවර්ධන සමිති , කාන්තා ග්‍රාම සංවර්ධන සමිති සහ ප්‍රජා මධ්‍යස්ථාන වලට අවස්ථා 35 කදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව විධිමත් ටෙන්ඩර් පරිපාටිය හා ප්‍රසම්පාදන කමිටු තීරණ ආදිය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රදානය කර තිබුණි. මෙම ගණුදෙනු වලට අදාල මුදල එකතුව රු.6,790 ක් විය.

(iii) 1987 මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරයේ ) 28 වගන්තිය ප්‍රකාරව සභාවේ මුදල් කමිටුවේ වාර්තාවක් ලබාගැනීමෙන් තොරව ග්‍රාම සංවර්ධන සමිති , කාන්තා ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රජා මධ්‍යස්ථාන වලට මාර්ග කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට නගරාධිපති විසින් තීරණය කර තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා අත් පොතේ 3.9.1 වගන්තියට පටහැනිව අනුමත සමිති වලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට නගරාධිපති , නියෝජ්‍ය නගරාධිපති හා සභා මන්ත්‍රීවරුන් ඉල්ලීම් කර තිබුණි.

(v) ඉහත සඳහන් ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා ග්‍රාම සංවර්ධන සමිති වල පොත් හා ලියකියවිලි පරීක්ෂා කිරීමේදී ඒවා මූල්‍යමය වශයෙන් දුර්වල හා හැකියාවෙන් අඩු සමිති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය ප්‍රකාර ඉහත අවශ්‍යතා පරීක්ෂා කිරීමෙන් තොරව කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.

(vi) මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත්තු කිහිපයක් ප්‍රජා මධ්‍යස්ථාන වලට ප්‍රදානය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ අත් පොතේ 3.9.1 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ හැක්කේ ප්‍රජා මධ්‍යස්ථාන වලට නොව පළාත් පාලන අංශයේ සංවර්ධන කටයුතු වල යෙදෙන ප්‍රජා සංවර්ධන සමිති වලටය.

(vii) පවත්නා මාර්ග මතුපිට සකස් කිරීම , මට්ටම් කිරීම් හා සම්ප්‍රේෂණය කිරීම් පිරවීම අනුමත බොරළු ප්‍රවාහනය, යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් ඇතිරීම හා සම්ප්‍රේෂණය කිරීම ආදිය සතුටුදායක ලෙස නිම කර නොතිබූ බව නිරීක්ෂණය විය.

**2:8 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) ආදායම් පරිපාලනය